# කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු වසර පරීක්ෂණය (බාහිර ) - 2008

**BCOM E 1035 – වාණි.වි. - මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

01. ප්‍රධාන කාර්යාලය සහ එහි ශාඛාව තම ගිණුම් පොත් පවත්වාගෙන යන අතර ලාභාලාභ ගිණුම් වෙන වෙනම පිළියෙල කරයි. 2009. 03. 31 දිනට පොත්වල ශේෂයන් පහත පරිදි වේ.

| | ප්‍රධාන කාර්යාලය | | ශාඛාව | |
|---|---|---|---|---|
| | හර (රු) | බැර (රු) | හර (රු) | බැර (රු) |
| ලැබියයුතු බිල්/ගෙවියයුතු බිල් | - | 18,880 | 9,600 | - |
| ණයගැති/ණයහිමි | 125,600 | 63,360 | 93,440 | 46,720 |
| බැංකු මුදල් | 171,840 | - | 70,720 | - |
| ස්ථාවර වත්කම් | 725,600 | - | 255,040 | - |
| ප්‍රාග්ධනය | - | 1,411,200 | - | - |
| ජංගම ගිණුම් | 477,760 | - | - | 448,320 |
| ලා/ලා ගිණුම් | - | 234,560 | - | 48,960 |
| තොග | 227,200 | - | 115,200 | - |
| | 1728,000 | 1728,000 | 544,000 | 544,000 |

අතිරේක තොරතුරු පහත පරිදි වේ.

i. ප්‍රධාන කාර්යාලය 2009.03.27 දින ශාඛාවට යැවූ රු. 7040 ක භාණ්ඩ 2009.04.03 වන විටත් ළඟා වී නොතිබුනි.

ii. 2009.03.30 දින ශාඛාව රු. 16,000 ක බැංකු අණකරයක් ප්‍රධාන කාර්යාලයට යැවූ අතර එය එහි ළඟා වූයේ 2009.03.31 දිනට පසුවය.

iii. ශාඛාවේ ඇති ඇතැම් වත්කම් සඳහා වෙන් නොකල ක්ෂය රු. 4000/-

iv. ප්‍රධාන කාර්යාලය සපයනු ලබන පරිපාලන සේවය වෙනුවෙන් රු. 4800/- ක ගාස්තුවක් ශාඛාවෙන් අය කළ යුතු වේ.

v. තොග මාර්ගස්ථව තිබියදී රු. 6400/- වටිනා තොග සොරාගත් අතර, ප්‍රධාන කාර්යාලය මෙම තොග ඉන්වොයිස් කර ශාඛාවෙන් අයකරගෙන තිබේ. රක්ෂණ ආයතනය මෙම අලාභය ආවරණය කිරීමට රු. 3700/- ක් පමණක් ගෙවීමට එකඟව ඇත.

vi. ශාඛා ලාභය ප්‍රධාන කාර්යාලයේ පොත්වලට මාරු කළ යුතුය.

ඔබ විසින් පිළියෙල කිරීමට අවශ්‍ය වන්නේ.

(a) ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවේ ජංගම ගිණුම්

(b)2009.03.31 දිනට ශේෂ පත්‍රය

(ලකුණු 30)

02. 'ඒ, බී සහ සී' හවුල්ව්‍යාපාරයක නිරතව ඇති අතර 2 : 1 : 1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනී. 2009.03.31 දිනට හවුල්ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පහත දී ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | | ස්ථාවර වත්කම් | | |
| 'ඒ ' | 77,000 | | ඉඩම් සහ ගොඩනැගිලි | | 112,000 |
| 'බී' | 44,800 | | යන්ත්‍ර | 21,000 | |
| 'සී' | 35,000 | 156,800 | (-) ක්ෂය වෙන්කිරීම | (8400) | 12,600 |
| ජංගම වගකීම් | | | ලීබඩු | 7,000 | |
| ණයහිමි | 5740 | | (-) ක්ෂය වෙන්කිරීම | (2,800) | 4,200 |
| බැංකු අයිරාව | 8960 | 14,700 | | | 128,800 |
| | | | ජංගම වත්කම් | | |
| | | | තොග | 33,600 | |
| | | | ණයගැති | 9,100 | 42700 |
| | | 171,500 | | | 171,500 |

2009.03.31 දින එදින සිට හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට එකඟ වූ අතර අදාල තොරතුරු පහත පරිදි වේ.

i. 'බී' මහතා ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යන අතර පහත දෑ පවරා ගැනීමට එකඟ විය

| | |
|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | රු. 168,000 |
| යන්ත්‍ර | රු. 15,400 |
| තොග | රු. 36,400 |
| ණයගැති | රු. 8,540 |

ii. මිලදී ගැනීමේ කාර්යය මූල්‍යයනය කිරීමට වසර 10 කට, රු. 126,000ක බැංකු ණයක් 'බී' මහතා ලබා ගන්නා ලදී.

iii. විසුරුවා හැරීමේ ගනුදෙනු අවසන් කිරීමේදී 'බී' මහතා ගෙවිය යුතු ශේෂයක් තිබේ නම් එය 'ඒ ' මහතාගේ ප්‍රාග්ධන ගිණුමට අයකිරීමට එකඟ විය.

iv. 'සී' මහතා ලී බඩු රු. 4060/- ට මිලදී ගැනීමට එකඟ විය.

v. ණයහිමියන්ට ගෙවිය යුතු මුදල සහ වත්කම් මුදල් බවට පත්කිරීමේ වියදම වන රු. 2100/- හවුල්ව්‍යාපාරයේ සම්පත් වලින් ගෙවිය යුතුය.
සියලුම ගනුදෙනු 2009.04.01 දින සම්පූර්ණ කරන ලදී.

ඔබ විසින්, පිළියෙල කල යුතු වන්නේ.

a) හවුල් ව්‍යාපාර උපලබ්ධි ගිණුම

b) හවුල් ව්‍යාපාර බැංකු ගිණුම

c) හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

d) 2009.04.01 දිනට 'බී' මහතාගේ ශේෂ පත්‍රය

03. 2006.04.01 දින රනිල් සහ සමාගම කුලී පිට ගැනුම් ක්‍රමයට 'ඒබීසී' සමාගමෙන් යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

i. යන්ත්‍රයේ මුදල් වටිනාකම රු. 325,000

ii. ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී රු. 130,000 ක මුදලක් ගෙවිය යුතු වේ.

iii. ශේෂය රු. 65,000 ට පොලිය එකතු කොට වාර්ෂික වාරික ලෙස ගෙවිය යුතුය.

iv. වාර්ෂිකව 6% බැගින් ඉතිරි ශේෂය මත පොලී අයකල යුතුය.

v. ක්ෂය කිරීම වාර්ෂිකව 10% බැගින් හීන වන ශේෂ ක්‍රමය මත ලියා හල යුතුය.

ඔබ විසින්,

2007.03.31 , 2008.03.31 සහ 2009.03.31 දිනෙන් අවසන් වර්ෂයන් සඳහා අදාල ගිණුම් සහ එදිනට ශේෂපත්‍රයන්ගෙන් කල උපුටාගැනීම් පෙන්වන්න.

(ලකුණු 15)

04. 'පී, කියු සහ ආර්' සෙල්ලම් භාණ්ඩ මිලදී ගෙන විකිණීමේ බද්ධ ව්‍යාපාරයකට අනුයුක්ත විය. බද්ධ ව්‍යාපාරයට අදාල තොරතුරු පහත වේ.

| | | |
|---|---|---|
| 1/1 | - | 'පී'විසින් මාස 3 කට වෙළඳ ආයතනයක් රු. 30,000 කට කුලියට ගන්නා ලදී. |
| 10/1 | - | 'කියු' විසින් රු. 125,000 ක් වටිනා සෙල්ලම් භාණ්ඩ රවි මහතාගෙන් මිලදී ගන්නා ලදී. |
| 15/1 | - | 'පී' විසින් රු. 75,000 ක සෙල්ලම් භාණ්ඩ විකුණුම් සිල්වා මහතාට සිදුකරන ලදී. |
| 1/2 | - | ආයතනයේ විදුලි බිල වන රු. 1200 ක බිලක් 'පී' විසින් ගෙවීම. |
| 3/2 | - | 'කියු' විසින් රු. 3700 ක පොදු වියදම් දැරීම. |
| 15/2 | - | 'ආර්' විසින් රු. 120,000 ක සෙල්ලම් භාණ්ඩ විකුණුම් සිදු කිරීම. |
| 17/2 | - | රවි මහතාට ගෙවිය යුතු මුදල 'කියු' විසින් ගෙවීම. |
| 20/2 | - | ණයගැතියා ( සිල්වා මහතා) රු. 65,000 ක් ගෙවූ අතර එම මුදල 'පී' රඳවා ගන්නා ලදී. |
| 1/3 | - | රු. 60,000 සෙල්ලම් භාණ්ඩ විකුණුම් 'ආර්' විසින් සිදුකල අතර එම මුදල ඔහු ළඟ තබාගන්නා ලදී. |
| 3/3 | - | සෙල්ලම් භාණ්ඩ සොරකමක් සිදුවූ අතර අලාභය වන රු. 20,000 දරා ගැනීමට 'ආර්' එකඟ විය. |
| 15/3 | - | බද්ධ ව්‍යාපාරය අවසන් වූ අතර අවසාන තොගය රු. 5600 කට 'පී' රැගෙන යාමට එකඟ විය. ණයගැතියා ගෙවිය යුතු ශේෂය බොල්ණයක් ලෙස සැලකෙන අතර ඉන් 3/4 ක් අදාල විකිණීම සිදුකල පුද්ගලයා විසින් දැරිය යුතු වේ. ලාභා ලාභ බෙදාගැනීමේ අනුපාතය 3 : 2 : 1 ක් වේ. |

ඔබ විසින් සෑම පාර්ශවයකගේම පොත්වල බද්ධව්‍යාපාර ගිණුම් සහ සිහිවටන බද්ධ ව්‍යාපාර ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 15)

05. i. ශ්‍රී.ල.ගි.ප්‍ර අංක 19 (කල්බදු සඳහා ගිණුම්කරණය) ට අනුව පහත පද නිර්වචනය කරන්න.

1. මූල්‍ය කල්බදු
2. මෙහෙයුම් කල්බදු

ii. ශ්‍රී.ල.ගි.ප්‍ර අංක 19 ට අදාලව කළයුතු හෙළිදරව් කිරීම් 3 ක් දක්වන්න.

iii. ඉදිකිරීමේ ගිවිසුම් වර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)